දිනය: 2022.05.07
අංකය: 25

SRI LANKA
IMMIGRATION AND EMIGRATION

# මාධ්‍ය නිවේදනයයි
# ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතියේ සිදු කරනු ලබන හදිසි අලුත්වැඩියාවක් හේතුවෙන් අත්හිටුවා තිබූ ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු නැවත සාමාන්‍ය සේවය යටතේ (එක් දින සේවය හැර) පමණක් මැයි මස 09 වන සඳුදා දින සිට ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

මැයි මස 09 වන සඳුදා දිනයේදී භාර ගැනීමට කටයුතු කරනු ලබන්නේ මැයි 05,06 හා 09 යන දිනයන් හිදී සාමාන්‍ය සේවය යටතේ ගමන් බලපත්‍ර ලබා ගැනීම සඳහා වේලාවක් වෙන් කර ගත් සහ මැයි 05 දින සාමාන්‍ය සේවය යටතේ ගමන් බලපත්‍ර ලබා ගැනීම සඳහා අයදුම්පත් භාර දීමට පැමිණ දෙපාර්තමේන්තුව වෙතින් අංකයක් හෝ මුද්‍රාවක් ලබා ගත් අයදුම්කරුවන්ගේ අයදුම්පත් පමණි.

තවද,මැයි මස 10 වන අඟහරුවාදා දින සිට ගමන් බලපත්‍ර අයදුම්පත් භාර දීම සඳහා දිනයක් හා වේලාවක් වෙන් කර ගැනීම අනිවාර්යය වේ. http://www.immigration.gov.lk/ වෙබ් අඩවිය වෙත පිවිස හෝ 0707101060 යන දුරකථන අංකය ඇමතීමෙන් දිනයක් හා වේලාවක් වෙන් කර ගැනීම සිදු කල හැකිය.

එක් දින සේවය යටතේ ගමන් බලපත්‍ර නිකුත් කිරීම සඳහා පරිගණක පද්ධතිය පිළිසකර කිරීමට දෙපාර්තමේන්තු තාක්ෂණික කාර්ය මණ්ඩලය මේ වන විට යුහුසුළුව කටයුතු කරමින් සිටින අතර, හැකි ඉක්මනින් එක් දින සේවය යටතේ ගමන් බලපත්‍ර ලබා ගැනීම සඳහා කටයුතු යොදනු ලැබේ.එමඟින් මහජනතාව වෙත සිදුවන අපහසුතාවය පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරනු ලබන අතර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය මඟින් සපයනු ලබන අනෙකුත් සේවා,ප්‍රාදේශීය කාර්යාල මඟින් සිදු කරනු ලබන සේවා සහ ගුවන් තොටුපළ

ආගමන හා විගමන සේවා කටයුතු සාමාන්‍ය පරිදි සිදු කරනු ලබන බව දැනුම් දෙනු ලැබේ.

පාලක ජනරාල්
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව